සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

12 | S | I

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

# Third Term Test - Grade 13 - 2018

විභාග අංකය .............................

## සාමාන්‍ය පොදු පරීක්ෂණය

කාලය පැය දෙකයි මිනි: තිහයි.

උපදෙස්

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- 1 සිට 60 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරාගෙන එය උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි (x) යොදා දක්වන්න.

(1). 2018 අප්‍රේල් මාසයේ දී 21 වන පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උත්සවය පැවැත්වූ රට කුමක්ද?
1. කැනඩාව 2. ඕස්ට්‍රේලියාව 3. ජපානය
4. බ්‍රසීලය 5. මෙක්සිකෝව

(2). වසර 30 ට පමණ පසු 2018 මැයි මාසයේ දී සක්‍රිය වු 'කිලෝවෙයා' නැමති ගිනිකන්ද පිහිටි දූපත අයත් දූපත් සමූහය කුමක්ද?
1. මාලදිවයින 2. පිලිපීන 3. කැරිබියන් 4. හවායි 5. ෆිජී

(3). 2018.04.07 දින කොළඹ දී පවත්වන ලද 70 වන ලෝක සෞඛ්‍ය දින උත්සවයේ තේමාව කුමක්ද?
1. සැමට සුව දිවියක්
2. සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කරමු
3. බෝ නොවන රෝගවලින් තොර ජීවිතයක්
4. සැම තැනට සැම පුද්ගලයාම සඳහා සෞඛ්‍ය ආවරණය
5. සෞඛ්‍ය ආවරණය තුලින් සැමට සැමදින රැකවරණය

(4). ශ්‍රී ලංකාවේ පාසල් අවට දුම්වැටි අලෙවිය තහනම් කරමින් ගැසට් නිවේදනයක් නිකුත් කර ඇත. ඊට අනුව පාසලක් සහ දුම්වැටි අලෙවි කරන ස්ථානයක් අතර තිබිය යුතු අවම දුර කොපමණද?
1. 50 m 2. 100 m 3. 300 m 4. 500 m 5. 800 m

(5). තම සමාගමේ පාරිභෝගිකයන් මිලියන 10 ක ගේ පමණ රහස්‍ය දත්ත තෙවැනි පාර්ශ්වයක් වෙත ලබාදුන් බවට චෝදනා එල්ල වු සමාජ ජාල වෙබ් අඩවිය අයත් සමාගම කුමක්ද?
1. ටිවිටර් 2. ඇමසෝන් 3. වට්ස්ඇප් 4. ෆේස්බුක් 5. ගූගල්

(6). ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන සංඛ්‍යාව කීයද?
1. 225 2. 330 3. 341 4. 348 5. 350

(7) 2018 වර්ෂයේදී පවත්වන ලද පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා තරඟාවලියේදී කාන්තා බොක්සිං ඉසව්වෙන් ශ්‍රී ලංකවට රිදී පදක්මක් අත් කරදුන් ක්‍රීඩිකාව වන්නේ,
1. චමරි අතපත්තු 2. දීපිකා රුද්‍රිගු 3. අනූෂා කොඩිතුවක්කු
4. ජයන්ති කුරුඋතුම්පාල 5. ෂෙහානි අඹේපිටිය

(8). ශ්‍රී ලංකාවේ විශාලතම ජලාශය වන මොරගහකන්ද ජලාශය ඉදිකරනු ලැබ ඇත්තේ කුමන ගඟ හරස් කිරීමෙන්ද?
1. අඹන් ගඟ 2. වලවේ ගඟ 3. මැණික් ගඟ 4. කැළණි ගඟ 5. කළු ගඟ

(9). ඩිජිටල් සෞඛ්‍ය පිළිබඳ පොදු රාජ්‍ය මණ්ඩලීය මධ්‍යස්ථානයක් පිහිටුවීම පිළිබඳ අදහස් ඉදිරිපත් කළ ශ්‍රී ලාංකික වෛද්‍යවරයෙකු එම මධ්‍යස්ථානයේ ප්‍රථම සභාපති ලෙස තේරී පත් විය. එම වෛද්‍යවරයා කවුද?
1. අනිල් ජාසිංහ
2. වජිර දිසානායක
3. අනුරුද්ධ පාදෙනිය
4. එරන්ද වැලිඅංග
5. කාවින්ද ජයවර්ධන

(10). 2018 වර්ෂයේ ශීත සෘතු ඔලිම්පික් ක්‍රීඩා තරඟ පවත්වන ලද්දේ,
1. උතුරු කොරියාවේදී ය.
2. ජපානයේදී ය.
3. කැනඩාවේ දී ය.
4. ඕස්ට්‍රේලියාවේදී ය.
5. දකුණු කොරියාවේදී

(11). 2017 වර්ෂයේදී ශූරයින්ගේ කුසලානය සඳහා වූ ක්‍රිකට් තරඟාවලියේදී ජයග්‍රහණය ලබාගත් පකිස්ථානය සමඟ අවසන් මහා තරගයට සහභාගී වූ රට කුමක්ද?
1. ඉන්දියාව
2. එංගලන්තය
3. ශ්‍රී ලංකාව
4. බටහිර ඉන්දීය කොදෙව් දූපත්
5. දකුණු අප්‍රිකාව

(12). අන්තෝනියෝ ගුටේරිස් යනු,
1. පොදු රාජ්‍ය මණ්ඩලයේ ලේකම්වරයාය.
2. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම් වරයා ය .
3. ඇමෙරිකානු රාජ්‍ය ලේකම්වරයා ය.
4. නොබැඳි ජාතීන්ගේ සංවිධානයේ ලේකම්වරයා ය.
5. යුනෙස්කෝ සංවිධානයේ ලේකම්වරයා ය.

(13). එවරස්ට් කන්ද තරණය කළ පළමු ශ්‍රී ලංකිකයා වුයේ ජයන්ති කුරුඋතුම්පාලය. 2018 මැයි මාසයේ දී එවරස්ට් තරණය කළ දෙවන ශ්‍රී ලාංකිකයා බවට පත් වුයේ කවුද?
1. අතුල පෙරේරා
2. ජෙෆ්රි වැන්ඩසේ
3. ජොහාන් පීරිස්
4. සරත් සිල්වා
5. හිරාන් අල්මේදා

(14). සිංහල සිනමාවේ දියුණුව උදෙසා තම නිර්මාණශීලී දායකත්වය ලබා දුන් චිත්‍රපට අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුගේ අභාවය 2018 වර්ෂයේ මුල් භාගයේ දී සිදුවිය. එම අධ්‍යක්ෂවරුන් දෙදෙනා කවුද?
1. ඩබ්.ඩී. අමරදේව සහ ලෙස්ටර් ජේම්ස් පීරිස්
2. ධර්මසේන පතිරාජ සහ ජී.බී. සේනානායක
3. වසන්ත ඔබේසේකර සහ සේන සමරසිංහ
4. ලෙස්ටර් ජේම්ස් පිරිස් සහ ජී.බී. සේනානායක
5. ලෙස්ටර් ජේම්ස් පිරිස් සහ ධර්මසේන පතිරාජ

(15). එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 2018 වර්ෂයේදී නව කෘෂිකාර්මික ලෝක උරුම වැඩ පිළිවෙලක් ලෙස පිළිගන්නා ලද මල්වතු ඔය ආශ්‍රිතව ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘතිය කුමක්ද?
1. උදාගම් ව්‍යාපෘතිය
2. පාරම්පරික කෘෂි බීජ නිෂ්පාදන ව්‍යාපෘතිය
3. මල්වතු ඔය සංවර්ධන ව්‍යාපෘතිය
4. එල්ලංගා ගම්මාන ව්‍යාපෘතිය
5. ගංගා නිම්න සංවර්ධන ව්‍යාපෘතිය

(16). 6 සහ 8 යන සංඛ්‍යා දෙකෙන්ම බෙදෙන ඉලක්කම් දෙකේ සංඛ්‍යා ගණන කීයද?
1. 2
2. 3
3. 4
4. 5
5. 6

(17). පාර්සල් පහක මධ්‍යනය ස්කන්ධය 8 kg කි. වෙනත් පාර්සල් අටක මධ්‍යනය ස්කන්ධය 9 kg මෙම පාර්සල් සියල්ලේම මුළු ස්කන්ධය කීයද?
1. 100 kg
2. 112 kg
3. 114 kg
4. 120 kg
5. 124 kg

(18). කෑම වර්ගයක් සෑදීමට පිටි, සීනි, මාගරින් 3 : 2 : 1 අනුපාතයට මිශ්‍ර කළ යුතුය. මෙම කෑම වර්ගයෙන් 600 g සැකසීමට අවශ්‍ය සීනි ප්‍රමාණය කොපමණද?
1. 100 g
2. 150 g
3. 200 g
4. 250 g
5. 300 g

(19). ප්‍රශ්න 10 කින් යුත් ප්‍රශ්න පත්‍රයක නිවැරදි පිළිතුරකට ලකුණු 05 ක් ලබාදෙන අතර වැරදි පිළිතුරකට ලකුණු 08 ක් අඩු කරයි. ප්‍රභාත්ට මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු 24 ක් ලැබේ. ඔහු නිවැරදි පිළිතුරු සැපයු ප්‍රශ්න සංඛ්‍යාව කීයද?
1. 5
2. 6
3. 7
4. 8
5. 9

(20). පහත රූපයේ ඇති සමචතුරස්‍ර ගණන කීයද?



1. 35
2. 35
3. 45
4. 55
5. 65

(21). ආහාරයක අඩංගු පෝෂ්‍ය පදාර්ථ ප්‍රමාණ දැක්වෙන වට ප්‍රස්තාරයක් මෙහි දැක්වේ. කාබෝහයිඩ්‍රේට් නිරූපණය කර ඇති කේන්ද්‍රික ඛණ්ඩයේ කෝණයේ විශාලත්වය කීයද?




1. $145^0$
2. $150^0$
3. $160^0$
4. $165^0$
5. $170^0$

(22). දිග 200 m ක් ද පළල 180 m ක් ද වූ සෘජුකෝණාස්‍රාකාර බිම් කොටසක් වටා කම්බි පොටවල් 03 ක් ගැසීමට අවශ්‍ය කම්බි වල අවම දිග කොපමණද?

1. 760 m  2. 1140 m  3. 2280 m  4. 2300 m  5. 2320 m

(23). නිල්, රතු, සුදු හා කහ පාට කොඩි 04 ක් එක පේළියට සිටුවිය හැකි ආකාර ගණන කීයද?

1. 16  2. 24  3. 28  4. 30  5. 34

❖ **ප්‍රශ්න අංක 24 - 26 දක්වා පහත රූපය මත පදනම් වේ. ඉංග්‍රීසි අක්ෂරවලින් හැඳින්වෙන් සිසුන් නව දෙනෙකු අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී සිංහල, ගණිතය, ඉංග්‍රීසි, විද්‍යාව යන විෂයන් සමත් වූ ආකාරය මෙහි නිරූපණය වේ.**




(24). විෂයයන් 4 ම සමත් ශිෂ්‍යයා කවුද?

1. e  2. f  3. g
4. h  5. i

(25). ගණිතය සහ විද්‍යාව පමණක් සමත් ශිෂ්‍යයා කවුද?

1. d  2. e  3. f
4. g  5. h

(26). මෙම විෂය 04 න් ගණිතය පමණක් අසමත් ශිෂ්‍යා කවුද?

1. e  2. f  3. g
4. h  5. i

(27). එක්තරා යාන්ත්‍රයකට භාණ්ඩ 6 ක් නිපදවීමට මිනිත්තු 24 ක් ගතවේ. එම සීඝ්‍රතාවයෙන්ම එම යන්ත්‍රයට පැයකදී භාණ්ඩ කීයක් නිපදවිය හැකිද?

1. 4  2. 12  3. 15  4. 20  5. 24

(28). රැකියාවකට බඳවා ගැනීම සඳහා පැවති තරග විභාගයකට 350 දෙනෙක් ඉදිරිපත් වූහ. එ අය අතරින් 60% ක් සමත් වූහ. සමත් වූ සියළු දෙනාම සම්මුඛ පරීක්ෂණයට කැඳවන ලද අතර එයින් 1/3 ක් සම්මුඛ පරීක්ෂණයෙන් සමත් විය. සම්මුඛ පරීක්ෂණයෙන් සමත් වූ සංඛ්‍යාව කීයද?

1. 210  2. 200  3. 140  4. 110  5. 70

(29). පහත දී ඇති පතරොමෙන් සෑදිය නොහැකි ඝනකය කුමක්ද?




1. $A$  2. $B$  3. $C$  4. $D$  5. මේ කිසිවක් නොවේ.

(30). ශිෂ්‍යයෙක් බොත්තම්වලින් සකස් කරන ලද රටාවක පළමු අවස්ථා තුන රූපයේ දැක්වේ.



මෙම රටාවේ 10 වැනි අවස්ථාව සකස් කිරීමට අවශ්‍ය බොත්තම් ගණන කීයද?

1. 32  2. 40  3. 42  4. 50  5. 52

❖ **ප්‍රශ්න අංක 31 සහ 32 පහත සම්බන්ධතා මත පදනම් වේ.**

$P = \frac{1}{2} + \frac{2}{3}$ $Q = \frac{2}{5} - \frac{1}{3}$ $R = \frac{4}{5}\ x\ \frac{3}{4}$

(31). P,Q,R ආරෝහණ පිළිවෙළට සැකසූ නිවැරදි පිළිවෙළ කුමක්ද?

1. PQR 2. PRQ 3. QRP 4. QPR 5. RPQ

(32). පිළිතුර ලෙස අන්ත දශමයක් ලැබෙන්නේ කුමකින් ද?

1. P 2. Q 3. R 4. P සහ Q 5. Q සහ R

(33). 5 , 12 , 26 , 54 ............ මෙම රටාවේ ඊළඟ සංඛ්‍යාව කීයද?

1. 62 2. 76 3. 88 4. 110 5. 124

(34). ඝනකයක මුළු පෘෂ්ඨවර්ගඵලය 96 $cm^2$ කි. එම ඝනයේ පරිමාව කොපමණද?

1. 16 $cm^3$ 2. 48 $cm^2$ 3. 64 $cm^2$ 4. 192 $cm^2$ 5. 256 $cm^2$

(35). රූපා සීතාට වඩා වැඩිමල්ය. සීතා මාලාට වඩා වැඩිමල් නමුත් දීපාට වඩා බාලය. ගීතා මාලාට වඩා වැඩිමල් වන අතර සීතාට වඩා බාලය. බාලම තැනැත්තා කවුද?

1. සීතා 2. රූපා 3. දීපා 4. මාලා 5. ගීතා

❖ **ප්‍රශ්න අංක 36 සිට 39 දක්වා ප්‍රශ්න සඳහා පහත දක්වා ඇති විස්තරය ඇසුරින් පිළිතුරු සපයන්න.**

පැත්තක දිග 4 cm ක් වූ ඝණකය පැති 6 ම වර්ණ ආලේප කර එම ඝණකය පැත්තක දිග 1cm බැගින් වන කුඩා ඝණක වලට වෙන් කරන ලද්දේ නම්,

(36). වෙන් කරන ලද කුඩා ඝණන සංඛ්‍යාව කීයද?

1. 60 2. 64 3. 68 4. 70 5. 85

(37). පැති 03 ක වර්ණ ආලේප නොවී ඇති කුඩා ඝණක සංඛ්‍යාව කීයද?

1. 4 2. 6 3. 8 4. 10 5. 12

(38). පැති දෙකක පමණක් වර්ණ ආලේප වී ඇති කුඩා ඝණක සංඛ්‍යාව කීයද?

1. 12 2. 18 3. 20 4. 24 5. 28

(39). පැති 6 ම වර්ණ ආලේප වී නොමැති ඝණක සංඛ්‍යාව කීයද?

1. 8 2. 10 3. 12 4. 14 5. 16

❖ **ප්‍රශ්න අංක 40 සහ 41 යන ප්‍රශ්නවල එක් එක් ප්‍රශ්නයට කරුණු තුනක් සහ නිගමනයක් බැගින් අයත්වේ.**

- **කරුණුවලින් ඕනෑම එකක් භාවිත කර නිගමයට එළඹිය හැකි නම් A තෝරන්න.**
- **කරුණුවලින් I සහ II භාවිත කර නිගමනයට එළඹිය හැකි නම් B තෝරන්න.**
- **කරුණුවලින් I සහ III භාවිත කර නිගමයට එළඹිය හැකි නම් C තෝරන්න.**
- **කරුණුවලින් II සහ III භාවිත කර නිගමනයට එළඹිය හැකි නම් D තෝරන්න.**
- **කරුණුවලින් එකක් හෝ වැඩි ගණනක් භාවිතකර නිගමයට එළඹිය නොහැකි නම් E තෝරන්න.**

(40). නිගමනය - නුවන්, සුනිමල්ට වඩා උසය.

**I. කසුන්, නුවන්ට වඩා උසය. II. සුනිමල්, ජනිතට වඩා උසය. III. ජනිත, සමිතට වඩා උසය.**

1. A 2. B 3. C 4. D 5. E

(41). නිගමනය - උසස් පෙළ සමත්වූවන්ගෙන් 60% ක් රජයේ රැකියා ලබා ගත්හ.

**I. උසස්පෙළ සමත් වූවන්ගෙන් 22% ක් රජයේ රැකියා ලබාගත් අතර ඔවුන් විදේශ පුහුණුවකට ද තෝරා ගැනිණි.**

**II. උසස් පෙළ සමත් වූවන්ගෙන් 38 % කට වඩා රජයේ රැකියා ලබා නොගත්හ.**

**III. උසස් පෙළ සමත්වූවන්ගෙන් 38% ක් රජයේ රැකියා ලබාගත් නමුත් විදේශ පුහුණුවට තෝරාගෙන නැත.**

1. A 2. B 3. C 4. D 5. E

❖ **අංක 42 සහ 44 දක්වා ප්‍රශ්න පහත දැක්වෙන රූප සටහන් මත පදනම් වෙයි.**
**2000 සහ 2004 වර්ෂවල A නමැති රටෙන් විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාව ව්‍යාප්ත වූ ආකාරය පහත දැක්වේ.**




2000 වර්ෂයේ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 150     2004 වර්ෂයේ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 175

(42) 2000 වර්ෂයේ ජපානයට ශිෂත්ව ලැබූ සංඛ්‍යාව 2004 වර්ෂයේ එම රටට ශිෂ්‍යත්ව ලැබූ සංඛ්‍යාවෙන් කුමන අනුපාතය වේද?

1. $\frac{6}{14}$ 2. $\frac{9}{14}$ 3. $\frac{14}{9}$ 4. $\frac{3}{6}$ 5. $\frac{3}{4}$

(43). කොරියාව. කැනඩාව සහ ඇ.එ.ජ. යන රටවල් අතරෙන් 2000 - 2004 කාලය තුළ A නමැති රටට ලබා දුන් ශිෂ්‍යත්ව සංඛ්‍යාව වැඩි කර තිබූ රටවල් මොනවාද?

1. ඇ.එ.ජ. පමණයි.
2. කැනඩාව හා ඇ.එ.ජ. පමණයි.
3. ඇ.එ.ජ. සහ කොරියාව පමණිය.
4. මේ රටවල් තුනම ශිෂ්‍යත්ව ප්‍රමාණය වැඩි කර ඇත.
5. මේ රටවල් තුනම ශිෂ්‍යත්ව ප්‍රමාණය වැඩි කර නැත.

(44). 2000 වර්ෂයේ දී සිසුන් 25 ට වඩා වැඩි සංඛ්‍යාවකට ශිෂ්‍යත්ව ලබා දුන් රටවල් ගණන කීයද?

1. එකයි. 2. දෙකයි. 3. තුනයි. 4. හතරයි. 5. පහයි

❖ **ප්‍රශ්න අංක 45 - 47 තෙක් දැක්වෙන තොරතුරු මත පදනම් වේ.**

**A, B, C, D යන රතුපාට කොඩි හතරක් ද F, G, H, I යන කහපාට කොඩි හතරක් ද පිට්ටනියක් වඩා සවි කිරීමට නියමිත ය. කොඩි තුනක් එක් පසෙකද තවත් කොඩි තුනක් පිට්ටනියේ අනෙක් පසද එක් කොඩියක් පිවිසුම් දොරටුව අසලද තවත් කොඩියක් ඊට විරුද්ධ පැත්තේ ද සවි කළ යුතුය. කොඩි සවි කිරීමේ දී පහත සඳහන් කොන්දේසි වලට අනුව සවි කළ යුතුය.**

- **පිට්ටනියේ එකම පැත්තේ එක ළඟ රතු හෝ කහ කොඩි දෙකක් සවි නොකළ යුතුය.**
- **පිවිසුම දොරටුව පැත්තේ සහ ඊට ප්‍රතිවිරුද්ධ පැත්තේ ඇති කොඩි එකම වර්ණයක් නොවිය යුතුය.**
- **H සහ C කොඩි එකම පැත්තේ සවි නොකළ යුතුය.**
- **I සහ D කොඩි එකම පැත්තේ සවි නොකළ යුතුය.**

(45). I පිට්ටනියේ පිවිසුම් දොරටුව පැත්තේ ද C පිට්ටනියේ එය පැත්තක මැද ද සවිකර තිබේනම් පහත දැක්වෙන ඒවායින් සත්‍ය විය හැක්කේ කුමක්ද?

1. I සවිකර ඇත්තේ පිවිසුම් දොරටුවට ප්‍රතිවිරුද්ධ පැත්තේ ය.
2. F සවිකර ඇත්තේ පිවිසුම් දොරටුවට ප්‍රතිවිරුද්ධ පැත්තේ ය.
3. A සහ C එකම පැත්තේ සවිකර ඇත.
4. G ඇත්තේ C තිබෙන පැත්තට විරුද්ධ පැත්තේ ය.
5. H ඇත්තේ C තිබෙන පැත්තට විරුද්ධ පැත්තේ ය.

(46). H පිවිසුම දොරටුවට ප්‍රතිවිරුද්ධ පැත්තේ ද, I පිට්ටනියේ පැත්තක මැදින් ද C පිට්ටනියේ අනෙක් පැත්තේ මැදින් ද සවිකර තිබේ නම් පිවිසුම දොරටුව පැත්තේ තිබිය යුතු කොඩිය කුමක්ද?

1. A 2. B 3. D 4. F 5. G

(47). G පිට්ටනියේ පිවිසුම් දොරටුවට ප්‍රතිවිරුද්ධ පැත්තේ ඇත. I එක් පැත්තක අවසානයට සවිකර ඇති අතර C අනෙක් පැත්තේ සවිකර ඇත. H සවිකර ඇත්තේ කුමන ස්ථානය ද?

1. පිවිසුම දොරටුව පැත්තේ ය.
2. I තිබෙන පැත්තේ මැදින් ය.
3. I තිබෙන පැත්තේ අවසානයට යි.
4. C තිබෙන පැත්තේ මැදින් ය.
5. C තිබෙන පැත්තේ අවසානයටයි.

❖ **අංක 48 සහ 49 යන ප්‍රශ්න දෙකෙහි අනුපිළිවෙළින් නැති ප්‍රකාශ තුනක් කුඩා ඡේද පහ බැගින් දැක්වේ. නැවත පිළිවෙළට සකස් කළ පසු සිදුවීම් අනුපිළිවෙළින් දැක්වෙන ඡේද තෝරන්න.**

(48). 1. තිසරු පස්වන ශ්‍රේණියේ ඉගෙනුම් ලබයි. තිසරු තම යහළුවා සමග පෞද්ගලික පන්තියකට සහභාගී වෙයි. තිසරු සාමාන්‍යයෙන් තම පියාගේ මෝටර් රථයෙන් පාසලට යයි.
2. නිමාලි සතුටින් සිටියි. නිමාලි විශ්ව විද්‍යාලයට තේරී ඇති බව දන්වමින් ලිපියක් ලැබී ඇත. නිමාලිගේ මව ඒ බව නිමාලිට දුරකතනයෙන් දැනුම් දුන්නා ය.
3. තරුෂ දිනපතා පාසලට යයි. තරුෂගේ පියා යතුරු පැදියෙන් වැඩට යයි. තරුෂ සවස් කාලයේ යහළුවන් සමග ක්‍රිකට් ක්‍රීඩා කරයි.
4. තිළිණ සතුටින් සිටියි. තිළිණ දිනපතා ව්‍යායාම් කරයි. ව්‍යායාම කිරීමෙන් නිරෝගී දිවියක් ගත කළ හැකිබව වෛද්‍ය මතයයි.
5. නදීර දක්ෂ ක්‍රීඩකයෙකි. නදීර සවස් කාලයේ ක්‍රීඩා පුහුණුවීම් වල යෙදේ. නදීරගේ සහෝදරයා පාසල් ක්‍රිකට් කණ්ඩායම නියෝජනය කරයි.

1. 1 2. 2 3. 3 4. 4 5. 5

(49). 1. ඉන්ධන භාවිතය වැඩිවීම නිසා පරිසර දූෂණය ඉහළ ගොස් ඇත. බස් රථ ධාවනය සඳහා ඉන්ධන වශයෙන් ඩීසල්, භාවිත කෙරේ. ඩීසල් මිළ වැඩිවීම නිසා බස් ගාස්තු වැඩිවේ.
2. පොලිතීන් නිසා පස දූෂණය වේ. පොලිතීන් අලෙවිය අඩුවී ඇත. වැඩි දෙනෙක් දිරායන ද්‍රව්‍යවලින් සකස් කරන ලද ඇසුරුම් භාවිත කරයි.
3. අධිවේගී මාර්ග ඉදිවෙමින් පවතී. අධිවේගී මාර්ග නිසා ගමනාගමනය සඳහා ගතවන කාලය අඩුවේ. චීනය අධිවේගී මාර්ග සඳහා ණය ලබා දේ.
4. පිටිකිරි ආනයනය සඳහා විදේශ විනිමය විශාල ලෙස වැයවේ. දියර කිරි භාවිතයට මහජනතාව නැඹුරු විය යුතුය. නවසීලන්තය පිටිකිරි අපනයනයට ප්‍රසිද්ධ රටකි.
5. ශ්‍රී ලංකාව තේ නිෂ්පාදනය කරයි. ශ්‍රී ලංකාවේ තේ සඳහා ඉහළ ඉල්ලුමක් ඇත. තේ වතුවල වල් පැළ මර්ධනය කිරීමට රසායනික ද්‍රව්‍ය භාවිතා කෙරේ.

1. 1 2. 2 3. 3 4. 4 5. 6

❖ **අංක 50 සහ 51 ප්‍රශ්න A සිට I තෙක් නම් කරන ලද පියවර නවය බැගින් ඇති සංවාද දෙකක් මත පදනම් වේ. ඒ පියවර දක්වා ඇත්තේ අනුපිළිවෙළකට නොව අවුල් සහගත ලෙසිනි. සංවාදවල නිසි අනුපිළිවෙළ දැක්වෙන වරණය තෝරන්න.**

(50).
A. විදුලිය නැත්තේ කොහේද?
B. අපේ ප්‍රදේශයේ විදුලිය ඇණහිටීමක් ගැන දැනුම් දෙන්න ඕනෑ.
C. නැවත විදුලිය ලැබෙන්නේ කීයට විතර ද?
D. ඔව්, මහත්මයා, ඔබට මොකක්ද දැනගන්න වුවමනාව
E. අද සාරගම ප්‍රදේශයේ විදුලි නඩත්තු කටයුත්තක් නිසා විදුලිය විසන්දි කරලයි තියෙන්නේ.
F. අද සවස 6.00 ට විදුලිය ලබා දෙනවා.
G. හලෝ ඔය විදුලි බල මණ්ඩල ප්‍රාදේශීය කාර්යාලයද?
H. හොදයි බොහොම ස්තුතියි
I. කුරුණෑගල සාරගම ප්‍රදේශයේ

1. GDABEICFH 2. ABEIGDFCH 3. ABIGDEFCH
4. GDEIBACHF 5. GDBAIECFH

(51).
A. ඔයා තරගවලටත් සහභාගී වුනාද?
B. ඔයාට ලැබුණු තෑග්ග මොකක්ද?
C. මම ජනගායනා තරගයෙන් පළමුවැනියා වුනා
D. ඔව් මම ගියා
E. ඔයාට දිනන්න පුළුවන් වුනා ද?
F. ඔයා අවුරුදු උත්සවය බලන්න ගියාද?
G. මට ජංගම දුරකථනයක් තෑගි ලැබුණා.
H. ඔව් මට තරග කිහිපයකට සහභාගී වුණා.
I. මගේ සුභ පැතුම් ඔයා හරිම දක්ෂයි.

1. FDAEGIBGC 2. FDAHECIBG 3. EFDACBHIG
4. FDEHCBIGH 5. CBGAIEDF

❖ **ප්‍රශ්න 52 හා 53 ප්‍රශ්නවලට එක් එක් ප්‍රශ්නය සඳහා A සිට F දක්වා ප්‍රකාශ 06 ක් බැගින් දී ඇත. ප්‍රකාශ තුනක් කාලානුරූපව පෙළගැස්විය හැකි ය. එසේ කාලානුරූපව පෙළගැස්විය හැකි ප්‍රකාශවලට හිමි අකුරු අඩංගු පිළිතුර තෝරන්න.**

(52). A. අජිත්ගේ පියා විශේෂඥ වෛද්‍යවරයෙකි.
B. අජිත් වෛද්‍ය විද්‍යාව සම්බන්ධ පොත්පත් කියවයි.
C. අජිත් උසස්පෙළ ජීව විද්‍යා විෂය ධාරාව හදාරයි.
D. අජිත්ගේ සොහොයුරා විදේශ රටක අධ්‍යාපනය ලබයි.
E. අජිත් දැන් උනන්දුවෙන් ඉගෙනීමේ කටයුතුවල නිරත වෙයි.
F. අජිත්ගේ බලාපොරොත්තුව වෛද්‍යවරයකු වීමයි.

1. FEA 2. AEF 3. CEF 4. CFA 5. DAC

(53). A. ජලය පිරිසිදු කොට පානය කිරීම වඩාත් ප්‍රායෝගික සුදුසු ක්‍රමයයි.
B. අපිරිසිදු ජලය පානය ශරීර සෞඛ්‍යයට අහිතකර වෙයි.
C. ජලය පිරිසිදුකර අලෙවි කිරීම ස්වයං රැකියාවක් බවට පත්ව ඇත.
D. දිනෙන් දින වැඩිවන ජනගහනය ස්වාභාවික, පිරිසිදු ජල මූලාශ්‍ර අහිමිවීමට හේතුවකි.
E. නළ ළිං ඉදිකිරීම සීමා කිරීම සඳහා නීති පනවා ඇත.
F. වැඩුණු මිනිසකුගේ ශරීර බරෙන් 60% - 65% පමණ ජලයෙන් සමන්විත වේ.

1. DBA 2. DFC 3. ECD 4. ABE 5. FDB

❖ **ප්‍රශ්න අංක 54 හා 55 සඳහා පහත ඡේදය ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

**1970 දශකය ආරම්භයක් සමග මතුපිට තලයට පැමිණි වර්තමානය වන විටද විසඳී නැති තරුණ වියට අදාළ ගැටළු බොහෝමයකට සමකාලීන ආර්ථික පරිසරයට පමණක් නොව අතීතයේ ක්‍රියාත්මක වූ ආර්ථික පසුබිමද හේතු වී ඇති බව ඒ පිළිබඳව අදහස් දක්වන විද්වතුන් බොහෝ දෙනෙක් ප්‍රකාශ කරති. සමකාලීන ආර්ථික පසුබිම මත අදාළ සමාජයේ සියළු චර්යාවන් හා ක්‍රියාකාරකම් තීරණය වන්නේ ය. යන්න සමහර සමාජ විද්‍යාඥයින්ගේ මතයයි.**

(54) ඡේදයේ ප්‍රධාන අදහස සමග වඩාත් ගැළපෙන ප්‍රකාශය තෝරන්න.
1. 1970 සිට තරුණ ගැටළු විසඳීම කෙරෙහි විද්වත් අවධානය යොමුව ඇත.
2. ආර්ථික පසුබිම වෙනස් කළ විට තරුණ ගැටළු විසඳේ.
3. සමාජ විද්‍යාඥයින්ට අනුව සමාජයේ සියලු චර්යාවන් වෙනස් කළ විට ආර්ථික පසුබිම ද වෙනස් කළ හැක.
4. රටක තරුණ ගැටළු වැඩි සංඛ්‍යාවක් පැන නගින්නේ එම රටේ ආර්ථික පසුබිම මතය.
5. වර්තමාන තරුණ ගැටළු වලට හේතුව වර්තමාන දුර්වල ආර්ථික පසුබිමයි.

(55) මෙම ඡේදයෙන් සෘජුවම ප්‍රකාශ නොවන අදහස කුමක්ද?
1. නොවිසඳුනු තරුණ ගැටළු රාශියක් ඇත.
2. 1970 දශකයට පෙර තරුණ වියට අදාළ ගැටළු නොතිබිණි.
3. තරුණ ගැටළු ඇතිවීම කෙරෙහි සමකාලීන ආර්ථික පසුබිම බලපායි.
4. අතීත ආර්ථික පසුබිම ද තරුණවියට අදාළ ගැටළු වලට හේතුවකි.
5. සමාජ හැසිරීම් හා ක්‍රියාකාරම් යනු සමකාලීන ආර්ථික ක්‍රියාවලියේ ප්‍රතිඵල බවට මතයක් පවතී.

❖ **අංක 56 සහ 57 ප්‍රශ්න සඳහා හා ඡේද ඇසුරින් පිළිතුරු සපයන්න.**
**මසුන් හා වෙනත් සාගර ආහාරවල ඇතුලත් රසදිය ප්‍රමාණය 1950 පමණ කාලයේ සිට දිනෙන් දින ඉහළ ගොස් ඇති බව අධ්‍යයනයක් මගින් පෙන්වා දී ඇත. මේ අනුව ලෝකයේ වෙරලාශ්‍රිතව පිහිටි හා දුප්පත් රටවල් ගණනාවක වාසය කරන ජනතාව සෞඛ්‍යට අහිතකර ප්‍රමාණවලින් රසදිය මට්ටම් වලට නිරාවරණය වී ඇති බව මේ පර්යේෂකයින්ගේ අදහස වෙයි. මෙම අධ්‍යයනයට භාජනය වූ රටවල් 175 කින් 66ක ජනතාව 2001 - 2011 කාලයේ දී කලලයේ වර්ධනයට හිතකර යැයි සම්මත මට්ටම්වලට වඩා ඉහළ මෙතිල් මකරි මට්ටම්වලට නිරාවරණය වී ඇත.**

(56) ඡේදය සවිස්තරාත්මකව ප්‍රකාශ කර ඇත්තේ,
1. මත්ස්‍ය හා බාහිර සාගර ආහාර පිළිබඳවය.
2. වෙරළාශ්‍රිත හා අනිත් රටවල ජනතාවගේ සෞඛ්‍ය ප්‍රශ්න පිළිබඳවය.
3. සාගර දූෂණයේ අහිතකර බලපෑමක් පිළිබඳවය.
4. කලල වර්ධනයට මෙතිල් මර්කරි මට්ටමේ බලපෑම් පිළිබඳවය.
5. මසුන් සහ වෙනත් සාගර ආහාර වල රසදිය මට්ටම අඩුකිරීමේ අවශ්‍යතාව පිළිබඳවය.

(57). මෙම ඡේදයෙන් සෘජුවම ප්‍රකාශ නොවන අදහස
1. මාළුවල රසදිය අඩංගු විය හැක.
2. මසුන් ආහාරයට ගන්නා ප්‍රදේශවල ජනතාවගේ සෞඛ්‍යට තර්ජන එල්ල වී ඇත.
3. රටවල් 175 කින් 66 ක් හැරුන විට අනික් රටවල ජනතාව අනාගතයේ දී මෙතිල් මර්කරි (රසදිය) වලට නිරාවරණය විය හැක.
4. මෙතිල් මර්කර් (රසදිය) ළදරු කලලය වර්ධනයට අහිතකර ලෙස බලපායි.
5. කලලයේ වර්ධනයට අහිතකර නොවන මෙතිල් මර්කර් මට්ටමක් මසුන් හා වෙනත් සාගර ආහාර වල තිබිය හැක.

❖ **අංක 58 - 59 යන ප්‍රශ්න සඳහා පහත ඡේදය ඇසුරින් පිළිතුරු සපයන්න.**
**සීඝ්‍රයෙන් ගෝලියකරණයට හසුවන වත්මන් ලෝකයේ කඩිනම් ආර්ථික වර්ධනයේ මාර්ගෝපදේශකයා ලෙස සැලකිය හැකි අධ්‍යාපනය මූලික මිනිස් අයිතිවාසිකමකි. වත්මන් ලෝකයට ගැලපෙන තාක්ෂණික දැනුම පුහුණුව ලැබූ රටවලට පමණක් ලෝකයේ දියුණු රටවල් සමඟ තරඟකාරී ලෙස ඉදිරියට ඒමට හැකි වූ බව ජපානය, සිංගප්පූරුව, හොංකොං නැගෙනහිර ආසියාතික රටවල අත්දැකීම් වලින් සනාථ වී ඇත. මෙම රටවල පැවැති අඩු වැටුප් මට්ටම ආශිර්වාදයක් කර ගනිමින් අධ්‍යාපනය හා පුහුණුව මිශ්‍ර ව තාක්ෂණික ඥාණය මගින් ඉදිරියට පැමිණ ඇත.**

(58). ඉහත ඡේදයට අනුව සාවද්‍ය අදහස කුමක්ද?
1. ආර්ථික සංවර්ධනය සඳහා අධ්‍යාපනය අත්‍යවශ්‍ය සාධකයකි.
2. දියුණු රටවල් සමඟ තරග කිරීමට අධ්‍යාපනය තුළින් ලැබෙන තාක්ෂණික දැනුම හා පුහුණුව තිබිය යුතුය.
3. නැගෙනහිර ආසියානු රටවල් දියුණු රටවල් හා තරගකාරීව කටයුතු කරයි.
4. රටක දියුණු සඳහා එම රටේ අඩු වැටුප් මට්ටමක් යහපත් ලෙස බලපාන්නට පුළුවන.
5. දියුණු රටවල් සමඟ තරගකාරීව කටයුතු කල හැක්කේ නැගෙනහිර ආසියානු රටවලට පමණකි.

(59). මෙම ඡේදයෙන් දැක්වෙන ප්‍රධාන අදහස වන්නේ,
1. ගෝලියකරණය නිසා ආර්ථික වර්ධනය අඩාල වන බවය.
2. අධ්‍යාපනය තුළින් යහපත් පුරවැසියන් බිහිකළ හැකි බවය.
3. අධ්‍යාපනය, පුහුණුව හා තාක්ෂණික ඥාණය ආර්ථික සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය බවය.
4. නැගෙනහිර ආසියානු රටවල් මෙන් අනෙක් රටවල වැටුප් මට්ටම අඩු නොවීම ආර්ථික සංවර්ධනට බාධාවක් බවය.
5. ලෝකයේ දියුණු රටවල් සමඟ තරගකළ හැක්කේ නැගෙනහිර ආසියානු රටවල්ට පමණක් බවය.

(60). කිසියම් සිදුවීම් මාලාවකට අදාළ පින්තූර හයක් පහත දී ඇත. පින්තූරවල නිවැරදි අනු පිළිවෙල දැක්වෙන පිළිතුර තෝරන්න.



A B C D E F

1. CEFDBA
2. AEFCDB
3. CEDFBC
4. CFEDAB
5. FACEDB

### තෙවන වාර පරීක්ෂණය - மூன்றாந் தவணை பரீட்சை

### සාමාන්‍ය පොදු පරීක්ෂණය - 2018   13 ශ්‍රේණිය  -  පිළිතුරු පත්‍රය.

### பொதுச் சாதாரண பரீட்சை – 2018   தரம் 13 - விடைகள்

| | | | | | |
|---|---|---|---|---|---|
| (1) 2 | (11) 1 | (21) 4 | (31) 3 | (41) 3 | (51) 2 |
| (2) 4 | (12) 2 | (22) 3 | (32) 3 | (42) 5 | (52) 3 |
| (3) 4 | (13) 3 | (23) 2 | (33) 4 | (43) 1 | (53) 1 |
| (4) 2 | (14) 5 | (24) 3 | (34) 3 | (44) 3 | (54) 4 |
| (5) 4 | (15) 4 | (25) 5 | (35) 4 | (45) 5 | (55) 2 |
| (6) 3 | (16) 3 | (26) 1 | (36) 2 | (46) 3 | (56) 3 |
| (7) 3 | (17) 2 | (27) 3 | (37) 3 | (47) 3 | (57) 3 |
| (8) 1 | (18) 3 | (28) 5 | (38) 4 | (48) 2 | (58) 5 |
| (9) 2 | (19) 4 | (29) 4 | (39) 1 | (49) 2 | (59) 3 |
| (10) 5 | (20) 4 | (30) 2 | (40) 5 | (50) 5 | (60) 4 |